සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය II | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 3 |

**උපදෙස් :**

**I කොටසින් ප්‍රශ්න දෙකකට ද, II කොටසින් එක් ප්‍රශ්නයක් ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.** (*සෑම ප්‍රශ්නයකටම ලකුණු* 20 *බැගින් හිමි වේ.*)

## I කොටස

**01.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගති කිහිපයකි.

A. - ධ ධ ප ම ප ග රි B - නි ස ග ම ධ ධ ප C - ධ නි ස ම ග රි ස

**(i)** ඉහත රාග තුන හඳුනාගෙන අදාල ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිවෙලින් ලියන්න. (ලකුණු 3)

**(ii)** එම රාග තුනෙන් කැමති රාගයකට අදාල ඛ්‍යාල් මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ ස්ථායී කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 8)

**(iii)** ඉහත රාග තුනෙන් රාත්‍රී කාලයේ ගැයෙන රාගයක මේලය, ජාතිය වාදී, සංවාදී, ගායන සමය ලියන්න. (ලකුණු 5)

**(iv)** ඉහත රාග තුනෙන් ඔබ මෙතෙක් පිළිතුරු නොසැපයූ අනෙක් රාගයේ මධ්‍යල ගීතයකට හෝ මධ්‍යලය වාදිතයකට සුදුසු මාත්‍රා 08කට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 4)

**02. (i)** නිර්දේශිත රාග තුනකට අදාලව සකසා ඇති පහත වගුවෙහි A සිට H දක්වා හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු අදාල ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න. (ලකුණු 8)

| රාගය | මේලය | ජාතිය | වාදි ස්වරය | සංවාදි ස්වරය | ගායන සමය |
|---|---|---|---|---|---|
| ජයජයවන්ති | ඛමාජ් | A ........................ | B ........................ | ප | C ........................ |
| දේස් | D ........................ | E ........................ | රි | F ........................ | රාත්‍රී දෙවන |
| හංසධ්වනි | G ........................ | ඖඩව | ස | H ........................ | රාත්‍රී ප්‍රථම |

**(ii)** ඉහත වගුවෙන් දැක්වෙන රාග තුනෙන් කැමති රාගයක ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයේ අන්තරා කොටස ප්‍රස්ථාර කරන්න. (ලකුණු 6)

**(iii)** දේස් රාගය සහ තිලක්කාමෝද් රාගය අතර සමානකම් දෙකක් සහ අසමානකම් දෙකක් ලියන්න. (ලකුණු 4)

**(iv)** හංසධ්වනි රාගයට අදාළව මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 2)

**03. (i)** "චෞතාල් සහ ඒක්තාල්" හෝ "ත්‍රිතාල් සහ තිලවඩා" යන තාල යුගලයන්ගෙන් එක් යුගලයක් පමණක් තෝරාගෙන එම තාල දෙකේ සමානකම් තුනක් සහ අසමානකම් දෙකක් ලියන්න. (ලකුණු 5)

**(ii)** තිලවඩා තාලයේ ඨේකාව සමගුණ, දෙගුණ වශයෙන් තාල සංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 5)

**(iii)** ඔබ උගත් නිර්දේශිත රාගයකට අයත් ඛ්‍යාල් විලම්භලය ගීතයක හෝ විලම්භලය වාදිතයක ස්ථායි කොටස ප්‍රස්තාර කරන්න. (ලකුණු 8)

**(iv)** එම විලම්භලය ගීතයට හෝ වාදිතයට සුදුසු මාත්‍රා හතරක තානාලංකාරයක් ප්‍රස්ථාර කරන්න. (එක් මාත්‍රාවකට ස්වර හතරක්වත් ඇතුලත් විය යුතුයි.) (ලකුණු 2)

## II කොටස

**04.** පහත වගුවේ ඇතුලත් තොරතුරු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B |
|---|---|
| ආසාතාත්මකව ගැයේ. | අනාසාතාත්මකව ගැයේ. |
| සේ ගී විශේෂයකි | මෙහෙ ගී විශේෂයකි. |
| රජුන්, දෙවියන්, බුදුන් , ප්‍රභූන් උදෙසා ගායනා කර ඇත. | ජීවිතයේ කටුක බව, දරිද්‍රතාවය අඩු පඩි ලැබීම හා ආහාරපාන පිළිබඳ ගැටලු විස්තර වේ. |
| කෝට්ටේ යුගයෙන් ආරම්භ වී ඇත. | ගී පද මාලා සහ නාද මාලා සරල වන අතර ස්වර දෙක තුනකට වඩා ඇසුරු නොකරයි. |

**(i)** ඉහත A හා B කොටස්වල ඇතුලත් තොරතුරු අනුව අදාල ගායනා වර්ග දෙක නම් කරන්න. (ලකුණු 2)

**(ii)** A කොටසට අදාල ගායනා වර්ගයේ, වගුවේ ඇතුලත් නොවන වෙනත් ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

**(iii)** B කොටසට අදාල ගායනා වර්ගය තුළින් ඉස්මතුවන පරිසර සුන්දරත්වය, කාර්යයේ දුෂ්කර බව, අඹු දරුවන්ගේ දුරස් වීම ආදිය කරුණු, කවි පාද උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

**(iv)** සවිදම් යන්න කෙටියෙන් හඳුන්වා ගණපති සවුදමේ පළමු පාදයේ පද නිවැරදිව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 8)

**05. (i)** නූර්ති හා නාඩගම් රංග ශෛලින් හි සංගීත ලක්ෂණ කරුණු 06ක් ඇසුරෙන් සන්සන්දනාත්මකව ලියන්න. (ලකුණු 6)

**(ii)** කෝළම් රංග සම්ප්‍රදායේ සංගීත ලක්ෂණ 04ක් ලියන්න. (ලකුණු 4)

**(iii)** සොකරි රංග සම්ප්‍රදායේ රංග ලක්ෂණ 02ක් ලියන්න. (ලකුණු 2)

**(iv)** තෝඩායම, ඉන්නිසිය, උරුට්ටුව, තර්ගය, අගහාරං යන කරුණුවලින් හතරක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 8)

## III කොටස

**06.** පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්ථාර කොටස ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.



**(i)** ඉහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්ථාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ලියන්න. (ලකුණු 6)

**(ii)** ස්වර ප්‍රස්ථාරයට අදාල ගීතය අයත් ස්කේලය හා හින්දුස්ථානි තාලය නම් කරන්න. (ලකුණු 4)

**(iii)** පහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්ථාරකරණයේදී යොදා ගැනෙන ප්‍රකාශන සංකේතවලින් පහක් නම් කර ඒවා විස්තර කරන්න.

A ⟶ ***pp***
B ⟶ ***p***
C ⟶ ***mp***
D ⟶ ***mf***
E ⟶ ***f***
F ⟶ ***ff***

G ⟶ <
H ⟶ >

(ලකුණු 2 x 5 = 10)

**07. (i)** පහත වගුවෙහි (i) සිට (x) දක්වා එක් එක් හිස්තැනට අදාල පිළිතුර අංකය සමග ලියා දක්වන්න.

(ලකුණු 10)

| නිර්දේශිත චිත්‍රපටය | චිත්‍රපට ගීතය | සංගීත අධ්‍යක්ෂ |
|---|---|---|
| **(i)** ................................ | කටේ කිරි සුවඳ | **(ii)** ................................ |
| සත් සමුදුර | **(iii)** ................................ | **(iv)** ................................ |
| **(v)** ................................ | කමලාසිනි | ෂෙල්ටන් ප්‍රේමරත්න |
| **(vi)** ................................ | කුඩා ගමේ | **(vii)** ................................ |
| **(viii)** ................................ | උන්මාද සිතුවම් | **(ix)** ................................ |
| විසිදෑල | ගුමු ගුමුව වදුලේ | **(x)** ................................ |

**(ii)** වඩාත් සිනමාරූපී සංගීත නිර්මාණයකට හිමිකම් කියන සත්සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය පිළිබඳ කරුණු පහක් ලියන්න. (ලකුණු 5)

**(iii)** චිත්‍රපට ගීයක ආවේනික ලක්ෂණ පහක් සඳහන් කරන්න. (ලකුණු 5)

**08.** පහත සඳහන් කරුණු අතරින් 04ක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

**(i)** භාත්ඛණ්ඩෙ පඬිතුමා වෙතින් භාරතීය සංගීතයට සිදු වූ සේවාව. (ලකුණු 5)

**(ii)** සංධ්වනියක ඇතුලත් සුවිශේෂි ලක්ෂණ. (ලකුණු 5)

**(iii)** ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශනයට බලපෑ අන්දම (ලකුණු 5)

**(iv)** වින්සන්ට් සෝමපාල මහතාගෙන් මෙරට සංගීත අධ්‍යාපනයට සිදු වූ සේවාව. (ලකුණු 5)

**(v)** ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය (ලකුණු 5)